# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 5 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 මාර්තු මස 27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1998 අංක 5 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 27 වන දින.]

එල්. ඩී.–බී. 66/96.

**මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 1998 අංක 5 දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෝටර් වාහන පනතේ 213 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ පනතේ පිළිවෙළින් 213අ සහ 213ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :– 203 වන අධිකාරයෙහි 213අ සහ 213ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.

213අ. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, සභාපතිවරයකුගෙන් හා වෙනත් සාමාජිකයන් දාහත්දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. ඒ සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :–

(අ) අදාළ අමාත්‍යවරයා විමසීමෙන් පසුව පත් කරනු ලබන, අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(ආ) අදාළ අමාත්‍යවරයා විමසීමෙන් පසුව පත් කරනු ලබන, මුදල් හා ක්‍රම සම්පාදන විෂයයන් භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(ඇ) අදාළ අමාත්‍යවරයා විමසීමෙන් පසුව පත් කරනු ලබන, පළාත් සභා හා පළාත් පාලන විෂයයන් භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

2—D045782—5,900 (97/10)

(ඇ) අදාළ අමාත්‍යවරයා විමසීමෙන් පසුව පත් කරනු ලබන, මහාමාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(ඉ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසීමෙන් පසුව පත් කරනු ලබන, ඒ පනත යටතේ පිහිටුවනු ලැබුවේ යයි සලකනු ලබන මොරටුව විශ්වවිද්‍යාලයේ නියෝජිතයෙක් ;

(ඊ) අදාළ අමාත්‍යවරයා විමසීමෙන් පසුව පත් කරනු ලබන, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙක් ;

(උ) අදාළ අමාත්‍යවරයා විමසීමෙන් පසුව පත් කරනු ලබන, 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ මාර්ග සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙක් ;

(ඌ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(එ) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත මගින් පිහිටුවනු ලැබූ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නියෝජිතයෙක් ;

(ඒ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් ;

(ඔ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ නියෝජිතයෙක් ;

(ඕ) අනතුරු වැළැක්වීමේ ලංකා සංගමයේ නියෝජිතයෙක් ;

(ඛ) ගමනාගමන වෛද්‍ය ආයතනයේ නියෝජිතයෙක් ;

(ග) 1957 අංක 19 දරන ලංකා ඔටෝමොබයිල් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා ඔටෝමොබයිල් සංගමයේ නියෝජිතයෙක් ;

(ච) පොලිස්පතිවරයා විමසීමෙන් පසුව පත් කරනු ලබන, පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් ;

(ජ) කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිවරයා විමසීමෙන් පසුව පත් කරනු ලබන, ඒ මහ නගර සභාවේ නියෝජිතයෙක් ;

(ට) රක්ෂණ පාලක හෝ ඔහුගේ නියෝජිතයෙක්.

(2) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සෑම සාමාජිකයකු ම, ඔහු මියයාමෙන්, තත් කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීමෙන් හෝ (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය හිස් කරනහොත් මිස, අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද පත් කිරීමේ ලිපියෙහි අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන අවුරුදු තුනක් නොඉක්මවන යම් කාලයක් ධූරය දැරිය යුතු ය. කාලය ඉකුත් වීමෙන් ධූරය හිස් කරන යම් සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(3) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ යම් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) යම් සාමාජිකයකු විසින් ධුරය හිස් කරන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්තිකයකු වශයෙන් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලැබූ සාමාජිකයා විසින්, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිවරයා විසින් අවශ්‍ය යයි සලකන කවර හෝ අවස්ථාවක, ඔහු විසින් ඒ සභාවේ රැස්වීම් කැඳවනු ලැබිය හැකි ය : එහෙත් යටත්පිරිසෙයින් සෑම මාස තුනකට ම එක් වරක් හෝ ඔහු විසින් ඒ සභාවේ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය :

එසේ වුවද, ඒ සභාවේ සාමාජිකයන් හය දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් සභාවේ රැස්වීමක් කැඳවන ලෙස සභාපතිවරයාගෙන් ලියවිල්ලකින් ඉල්ලා සිටින කවර හෝ අවස්ථාවක, සභාපතිවරයා විසින් ඒ සභාවේ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(6) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් අට දෙනකු විය යුතු ය.

(7) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් විධිවිධාන සලස්වමින් ද, ඒ සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරමින් ද, නියෝග සාදනු ලැබිය හැකි ය. ඒ නියෝගවලට සහ (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් එහි කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(8) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසා ම පමණක්, ඒ සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු ය.

(9) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් ආමාත්‍යවරයා විසින් ඒ සභාවට සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, ඒ සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(10) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍ය නියමිත පරිදි විය යුතු ය.

මාර්ග ආරක්ෂා අරමුදල.

213ආ. (1) මේ පනතේ VI වන කොටස යටතේ තෘතීය පාර්ශ්වයේ අවදානම් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් නිකුත් කරන සෑම රක්ෂකයකු හෝ තැනැත්තකු විසින් ම, අවස්ථාවෝචිත පරිදි, ඒ රක්ෂණ ඔප්පුව හෝ ඇපය සඳහා තමාට ගෙවනු ලබන වාරිකයෙන්, නියමිත මුදලට සමාන යම් මුදලක් අඩු කර එසේ අඩු කරනු ලැබූ මුදල (2) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට ප්‍රේෂණය කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) (මෙහි මින් මතු මේ වගන්තියේ "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්ග ආරක්ෂා අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. අරමුදල, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් පරිපාලනය හා කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(3) අරමුදලට–

(අ) (1) වන උපවගන්තිය යටතේ අරමුදලට ප්‍රේෂණය කරනු ලබන සියලු මුදල් ; සහ

(ආ) ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අරමුදලට ලැබෙන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(4) අරමුදලින්–

(අ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් අනුමත කරන ලදුව, මාර්ග ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම හා අනතුරු වැළැක්වීම සඳහා වූ

වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ වෙනත් නියමිත කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා හෝ අවශ්‍ය සියලු මුදල් :

(ආ) මෝටර් වාහන අනතුරු හේතු කොටගෙන මියගිය හෝ තුවාල සිදු වූ තැනැත්තන්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට, ඒ වාහන හඳුනාගනු නොලැබූ අවස්ථාවල දී මුදල් ආධාර සැපයීම සඳහා අවශ්‍ය සියලු මුදල් : සහ

(ඇ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ පරිපාලන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(5) අරමුදලට පරිත්‍යාග කරනු ලබන සියලු මුදල්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ අර්ථානුකූලව ආණ්ඩුව මගින් පිහිටුවනු ලැබූ අරමුදලකට පරිත්‍යාග කරන ලද මුදල් වන බව, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් , එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.